(හයවැනි පාර්ලිමේන්තුව —තෙවැනි සභාවාරය)

අංක. 15]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2008 අගෝස්තු මස 06 වැනි බදාදා පූ. භා. 9.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0042/'08

1.

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ ගිණුම් හා මූල්‍ය ආයතනයේ පසුගිය වසර 5 ඇතුළත ගිණුම් කවරේද;

(ii) එහි පුහුණු කරන ලද පුද්ගලයින් සංඛ්‍යාව හා එහි ක්‍රියාකාරකම්වලට අදාළ ක්ෂේත්‍ර කවරේද;

(iii) එම එක් එක් ක්‍රියාකාරකමෙහි නියැලෙන සිසුන් සංඛ්‍යාව කොපමණද; සහ

(iv) මෙම ආයතනයේ සැබෑ අරමුණ කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ආයතනයේ පාලක මණ්ඩලයේ සාමාජිකයින්ගේ හා අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

(ii) රාජ්‍ය කළමනාකරණ හා සංවර්ධන ගණකාධිකරණ ආයතනය නමින් ආයතනයක් තිබේද;

(iii) එම ආයතනයේ පුහුණු කර ඇති පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද; හා

(iv) එහි අරමුණ හා කාර්යභාරය කුමක්ද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) උක්ත රාජ්‍ය කළමනාකරණ හා සංවර්ධන ගණකාධිකරණ ආයතනය වරලත් තත්ත්වය ලබා ගැනීමට තීරණය කරනු ලැබුවත් 2003 වසරේදී එය නවතා දැමූ බව නිවැරදිද;

(ii) මෙම අදහස නැවත ක්‍රියාත්මක කිරීමට ඔවුන් උත්සාහ දරන්නේද; සහ

(iii) රජයේ ගිණුම් හා මූල්‍ය ආයතනයේ පාලනය සියතට ගැනීමට එය සැලසුම් කරමින් සිටින්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0043/'08

2.

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් එකතු කළ අගය මත බදු ආපසු ගෙවිය යුතු පුද්ගලයන්ට ගෙවීමට ඉතිරිව ඇති මුළු මුදල් ප්‍රමාණය 2004 සිට මේ දක්වා වාර්ෂික පදනමින් කොපමණද;

(ii) රුපියල් මිලියන 10කට වැඩි මුදල් ප්‍රමාණයක් රජය විසින් ආපසු ගෙවිය යුතුව ඇති ආයතන කවරේද;

(iii) ඉහත සඳහන් ප්‍රමාණය පරීක්ෂා කොට තහවුරු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මුදල් ආපසු නොගෙවීමට හේතුවත්;

(ii) රජය ණය හිමියන්ට පොළී ගෙවන්නේද යන්නත්;

(iii) එසේ නම්, එම ප්‍රතිශතය හා එය ගෙවූ දිනයත්;

එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) වැට් බදු වංචාවෙහි තත්ත්වය කුමක්ද;

(ii) ඒ හා සම්බන්ධ පරීක්ෂණයෙහි ප්‍රගතිය කුමක්ද;

(iii) එම පරීක්ෂණය අවසන් වීමට නියමිත දිනය කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0044/'08

3.

ගරු රවි කරුණානායක මහතා,— වාරිමාර්ග සහ ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය සහ ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැදුරු ඔය වාරිමාර්ග ව්‍යාපෘතිය ආරම්භ කළ දිනය සහ නිමකිරීමට සැලසුම් කළ දිනය කවරේද;

(ii) සමස්ත පිරිවැය කොපමණද;

(iii) අරමුදල් ලැබෙන මූලාශ්‍රය කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම වාරිමාර්ග ව්‍යාපෘතිය ක්‍රියාත්මකවීම හේතුවෙන්, එක් එක් මැතිවරණ කොට්ඨාසයන්හී යළි පදිංචි කිරීමට සිදුවන පවුල් සංඛ්‍යාව සහ පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එලෙස යළි පදිංචිකරනු ලබන්නේ කවදාද;

(iii) පුත්තලම දිස්ත්‍රික්කයේ කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවුල් අසූවක් යළි පදිංචි කර ඇතැයි යන්න නිවැරදිද;

(iv) එසේ යළි පදිංචිකර ඇත්නම්, සියලු මූලික පහසුකම් ලබාදී යළි පදිංචිකිරීමේ කටයුතු සඳහා අවශ්‍ය කරන මුදල් ඔවුන් වෙත ගෙවා තිබේද;

(v) ජලය හිඟකම සහ ඉහත ආකාරයෙන් ඔවුන්ට ලබා දුන් ඉඩම්වල අලින් විනාශකාරී ලෙස හැසිරීම වැනි අපහසුතාවලට ලක්වන්නේ යැයි ඉහත කී පුද්ගලයින් පවසන්නේද;

යන්නත් එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ඇ) (i) සංවර්ධනය නිමකිරීමෙන් පසුව පමණක් ආණ්ඩුව විසින් ඔවුන් යළි පදිංචි කරනු ලබන්නේහිද;

(ii) යළි පදිංචිකිරීමේ පිරිවැය සහ අරමුදල් මූලාශ්‍රය කවරේද;

(iii) 2007 ජූනි මස 11 වැනි දින ගරු අමාත්‍යවරයා ඇතුළු තවත් දේශපාලනඥයින් කීපදෙනෙක් දැදුරු ඔය නැරඹීමට පැමිණි විට අත්අඩංගුවට ගනු ලැබූ අහිංසක විරෝධතාකරුවන් විසිදෙනාට එරෙහිව කිනම් හෝ පියවරක් ගෙන තිබේද;

යන්න එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0381/'08

4.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ දැනට සේවය කරන සේවක සංඛ්‍යාව හා අදාළ තනතුරු කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත තනතුරු දරන අයගේ නම්, ලිපිනයන්, අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් කවරේද;

(ii) ඔවුන්ගේ මාසික වැටුප කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0627/'08

5.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) මාතලේ දිස්ත්‍රික්යේ රත්තොට පොලිස් බල ප්‍රදේශයට අයත් රත්තොට නගරයේ, "අනෝමා" නිවසේ පදිංචිව සිටි සරත් ගාමිණී ලියනගේ මහතා ඇතුළු ඔහුගේ බිරිඳ හා දියණිය 2004 සැප්තැම්බර් මාසයේ සිට අතුරුදහන් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) දේශපාලන පක්ෂයක ප්‍රබල ආධාරකරුවෙකු වන සරත් ගාමිණී ලියනගේ මහතාට 2004 මහ මැතිවරණයෙන් පසු මරණීය තර්ජන හා විවිධ බලපෑම් එල්ලවූ බවත්;

(ii) ඒ සම්බන්ධව රත්තොට පොලිසියටද පැමිණිලි කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) සරත් ගාමිණී ලියනගේ මහතා සහ ඔහුගේ පවුලේ සාමාජිකයින් දැනට ජීවතුන් අතර සිටින්නේද;

(ii) එසේ නම් ඒ කවර ස්ථානයකද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0408/'08

6.

ගරු අචල ජාගොඩගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2007 වර්ෂය තුළ එතුමාගේ අමාත්‍යාංශයට හෝ අමාත්‍යාංශය සතු දෙපාර්තමේන්තු හා සංස්ථා හෝ වෙනත් ආයතන සඳහා අලුතින් පිරිසක් රැකියා සඳහා බඳවාගෙන තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම එක් එක් ආයතනය සඳහා බඳවාගෙන ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ ඒ තනතුර සඳහා බඳවාගෙන ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ අතුරින් සේවයේ ස්ථිර කර ඇති සංඛ්‍යාව සහ උපාධිධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0409/'08

7.

ගරු අචල ජාගොඩගේ මහතා,— තරුණ කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) 2007 වර්ෂය තුළ එතුමියගේ අමාත්‍යාංශයට හෝ අමාත්‍යාංශය සතු දෙපාර්තමේන්තු හා සංස්ථා හෝ වෙනත් ආයතන සඳහා අලුතින් පිරිසක් රැකියා සඳහා බඳවාගෙන තිබේද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම එක් එක් ආයතනය සඳහා බඳවාගෙන ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ ඒ තනතුර සඳහා බඳවාගෙන ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ අතුරින් සේවයේ ස්ථිර කර ඇති සංඛ්‍යාව සහ උපාධිධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0531/'08

8.

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ගෑස් සමාගම, ෂෙල් ගෑස් සමාගමට පවරා දෙනු ලැබුවේ කවදාද;

(ii) ඒ සඳහා අනුගමනය කරන ලද්දේ කවර ක්‍රියා පටිපාටියක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ටෙන්ඩර් කැඳවනු ලැබුවේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද සමාගම් හා මිල ගණන් වෙන් වෙන්ව කවරේද;

(ii) ෂෙල් සමාගම තෝරා ගනු ලැබුවේ කවර පදනම මතද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත ගෑස් සමාගමේ, රජය හා අනෙකුත් සමාගම් සතුව ඇති කොටස් ප්‍රමාණය වෙන් වෙන්ව කොපමණද;

(ii) අදාළ ගෑස් සමාගම ෂෙල් සමාගමට පැවරූ වර්ෂයේ සිට රජයට ලැබී ඇති ලාභාංශ ප්‍රමාණය වෙන් වෙන්ව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0533/'08

9.

ගරු අනුර දිසානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2007 වර්ෂයේ පාසල් පොත් ප්‍රදානය සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එම වර්ෂයේ දී එක් එක් විෂයයන් හා එක් එක් ශ්‍රේණි සඳහා මුද්‍රණය කරන ලද පොත් සංඛ්‍යාව වෙන් වෙන්ව කොපමණද;

(iii) එම පොත් මුද්‍රණය කරන ලද්දේ කවර ආයතන වලින්ද;

(iv) එම එක් එක් ආයතනයෙන් මුද්‍රණය කරන ලද පොත් සංඛ්‍යාව වෙන් වෙන්ව කොපමණද;

(v) එම ආයතනයන් තෝරා ගනු ලැබුවේ කවර පදනමකින්ද;

(vi) එම ආයතනයන් සඳහා ගෙවිය යුතු මුළු මුදල කොපමණද;

(vii) මේ වනවිට ගෙවා ඇති මුදල් ප්‍රමාණය හා හිඟ මුදල් ප්‍රමාණය වෙන් වෙන්ව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0534/'08

10.

ගරු අනුර දිසානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාසල් අධ්‍යාපනයේදී ශ්‍රේණි සඳහා නියමිත විෂය නිර්දේශ වෙනස් කරනු ලබන්නේ වසර කීයකට වරක්ද;

(ii) 2007 වර්ෂය තුළ කවර ශ්‍රේණි සඳහා විෂය නිර්දේශ වෙනස් කර තිබේද;

(iii) එම විෂය නිර්දේශයන් වෙනස් කිරීම සඳහා අනුගමනය කරන ලද ක්‍රමවේදය කවරේද; සහ

(iv) 2007 වර්ෂයේ විෂය නිර්දේශ වෙනස් කිරීම සඳහා අදාළ ශ්‍රේණි තෝරා ගනු ලැබුවේ කවර පදනමකින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0630/'08

11.

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල, උඩුගම අධ්‍යාපන කලාපයට අයත් පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් පාසැලේ පළමු ශ්‍රේණියේ සිට ඇති පංති සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් පාසලට අවශ්‍ය ගුරුවරුන් සංඛ්‍යාව සහ දැනට සේවය කරන ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) පුරප්පාඩු තිබෙන පාසල්වලට අවශ්‍ය ගුරුවරුන් ලබාදෙන්නේ කවර කාලසීමාවක් තුළද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම අධ්‍යාපන කලාපයට අයත්ව තිබූ වසා දමා ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) ගුරු හිඟය නිසා හෝ ළමුන්ගේ පැමිණීම අඩු නිසා හෝ වසා දැමීමට නියමිත පාසැල් කවරේද;

(iii) ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) කවර හෝ හේතුවක් නිසා වසා දැමීමට නියමිත පාසල්, විශේෂ කොට සලකා අවශ්‍ය භෞතික සම්පත් සහ ගුරුවරුන් ලබාදී එම පාසල් වැසීයාම වැළැක්වීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0631/'08

12.

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— ඉදිකිරීම් සහ ඉංජිනේරු සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2003 ගංවතුරින් කැඩීගිය ගිංගඟේ පාලම් වෙනුවට පාලම් 06 ක වැඩ කටයුතු 2006.03.27 දින ආරම්භ කරන ලද බවත්,

(ii) එකී පාලම් 2007.08.27 දින වැඩ නිම කිරීමට ගිවිසුම් අත්සන් කර තිබූ බවත්,

එතුමා දන්නෙහිද?

(ආ) එක් පාලමක් හැර ඉතිරි පාලම් 05 ක වැඩ 2007.12.31 වන දින නිම කිරිමට කටයුතු කරන බව පාර්ලිමේන්තු උපදේශක කාරක සභා යෝජනා අංක 1896 ට ලබාදුන් පිළිතුරු වාර්තාවේ සඳහන් වූ බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ වුවද කැටගොඩ පාලමේ ඉදිකිරීම් කටයුතු නතර කිරීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) පාලම රඳවා තැබීමට අවශ්‍ය කරන ප්‍රධාන කේබල් දෙක විදේශ රටකින් ඇණවුම්කර තිබෙන්නේ කවදාද;

(ii) පාලම් සඳහා නියමිත මුදල් ආසියානු සංවර්ධන බැංකුව මගින් දකුණු පළාත් ග්‍රාමීය ආර්ථික ප්‍රවර්ධන ව්‍යාපෘතියට ලබාදී තිබෙන අතර රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් සංස්ථාව (SD & CC) ට මුදල් ගෙවීම ප්‍රමාද වන්නේ කවර ආයතනයකින්ද;

(iii) පාලම් සඳහා මේ වන විට රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් සංස්ථාවට (SD & CC) ලබාදී ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) විශේෂ කටයුත්තක් ලෙස සලකා කැටගොඩ හා ඇහැලකන්ද පාලම් ඉදිකිරීම ගිවිසුම්ගත දිනයට නිම කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0647/'08

13.

ගරු එම්. ඩී. නාමල් කරුණාරත්න මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ කොබෙයිගනේ පොලිස් ස්ථානය වෙත 2006.01.01 දින සිට 2007.01.01 දින දක්වා ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(ii) එකී පැමිණිලි අතුරින් විභාගකර, තීන්දු ප්‍රකාශ කර තිබෙන පැමිණිලි සංඛ්‍යාව සහ විභාග නොකරන ලද පැමිණිලි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත විභාග නොකරන ලද පැමිණිලි ලැබුණු දිනය, පැමිණිල්ල බාරගත් නිලධාරියාගේ නම, පැමිණිල්ලේ ස්වභාවය සහ විභාග නොකිරීමට හේතුව කවරේද යන්න එක් එක් පැමිණිල්ලට අදාළව වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) උක්ත පැමිණිලි විභාග නොකිරීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0648/'08

14.

ගරු එම්. ඩී. නාමල් කරුණාරත්න මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ 2007 සහ 2008 වසරේ ක්‍රියාත්මක කිරීමට සැළසුම් කළ විශේෂ විදුලි ව්‍යාපෘති තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘති සංඛ්‍යාව සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ඒවා කවරේද;

(ii) මෙම ව්‍යාපෘති සඳහා මුදල් වෙන්වී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) එම එක් එක් ව්‍යාපෘතිය කවර කාලයක් තුළ වැඩ අවසන් කිරීමට නියමිතද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0670/'08

15.

ගරු සමන්සිරි හේරත් මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) නවගත්තේගම, වෙලේවැව, අංක 40 දරන ලිපිනයෙහි පදිංචි එම්. ජේ. එස්. රංජිත් යන අය 1989. 06. 15 වැනි දින සිට පොලිස් කොස්තාපල්වරයෙකු වශයෙන් සේවයට බැඳුනු බව එතුමා දන්නෙහිද?

(ආ) වෙන්නප්පුව පොලිස් පුහුණු අභ්‍යාස විද්‍යාලයට අනුයුක්තව පුහුණුව ලබමින් සිටියදී හදිසියේම ඔහුගේ පත්වීම අවලංගු කිරීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) 1992. 04. 10 දින සිට රංජිත් මහතා සේවයේ පිහිටුවීමට කටයුතු කරන ලද්දේ පත්වීම අවලංගු කිරීම යුක්ති සහගත නොවන නිසා ද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) අතිගරු ජනාධිපතිතුමාගේ නියෝගයකට අනුව අවුරුදු 16ට වැඩි කාලයක් පොලිස් සේවයේ රාජකාරි කර, උසස්වීම් නොලද අයට උසස්වීම් ලබාදීමේ තීරණයට අනුව 2006.02.23 වැනි දින සිට පොලිස් සැරයන් තනතුරට උසස්වීමක් ලද මොහු 2007.07.30 වැනි දින සිට වහාම ක්‍රියාත්මක වන පරිදි තනතුර පහත දමන ලද්දේ කවර හේතුවක් නිසාද;

(ii) මොහුට එරෙහිව කිසියම් විනය කඩකිරීමේ චෝදනාවක් තිබේ නම්, ඒ කවරේද;

(iii) මොහුගේ පත්වීමේ දිනය 1989.06.15 වන පරිදි පොලිස් දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබියදී, උසස්වීම් ලබාදීමේදී 1992.08.01 වැනි දින සිට සේවා කාලය ගණනය කළේ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඉ) රංජිත් මහතාට සාධාරණයක් ඉටුකිරීමට එතුමා අවශ්‍ය කටයුතු කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## **යෝජනා පිළිබඳ දැනුම්දීම**

1\.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

2\.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2008.06.05 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ. භා. 4.30 දක්වා විය යුතු ය. අ. භා. 4.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

3\.

ගරු (පූජ්‍ය) උඩවත්තේ නන්ද හිමි,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය.

" සමාජ සහන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනාව,— 1959 අංක 8 දරන පනතින් ද ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන 2008 අගෝස්තු මස 02 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

*2.

පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 142,— වැඩසටහන 2,—† 2008 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2008 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන දහ අටකට (රු. 18,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 142 | — | සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය |
| වැඩ සටහන | 2 | — | සංවර්ධන වැඩසටහන |
| ව්‍යාපෘතිය | 3 | — | සමාජ සංස්කෘතික ඒකාබද්ධව කටයුතු කිරීම |
| | | | පුනරාවර්තන වියදම් රු. 18,000,000 |
| | | | මුළු වියදම රු. 18,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

†2008 ජූලි මස 08 වැනි දින ඉදිරිපත් කරන ලද 2008 අංක 4 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 3 දක්වා එකතුව රුපියල් 3,198,180,332.

*4.

කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා,—පරිපූරක මුදල — ශීර්ෂය 118,— වැඩසටහන 02,—† 2008 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2008 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළහැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් එක්දහස් එකසිය අසූපන් කෝටි හතලිස් ලක්ෂයකට (රු.1,185,40,00,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 118 | — | කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය |
| වැඩ සටහන | 02 | — | සංවර්ධන වැඩසටහන |
| ව්‍යාපෘතිය | 03 | — | කෘෂිකාර්මික සංවර්ධනය |
| පුනරාවර්තන වියදම් | | | රු. 1,185,40,00,000 |
| මුළු වියදම | | | රු. 1,185,40,00,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

†2008 ජූලි මස 25 වැනි දින ඉදිරිපත් කරන ලද 2008 අංක 5 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 4 දක්වා එකතුව රුපියල් 3,216,180,332.

*5.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

චීන සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජූනි 17) [1]

*9.

ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*11.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04). [1]

*12.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18). [1]

*13.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*14.

සූදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*15.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04.) [1]

*16.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*17.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*18.

නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමා,— නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ නියෝග,— ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 21 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 ජූනි මස 27 වැනි දින අංක 1555/32 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.07.25 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*19.

පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා,— ජාතික පාරිසරික පනත යටතේ නියමය,— 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 අ වගන්තිය යටතේ පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 ජනවාරි මස 25 වැනි දින අංක 1533/16 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.07.25 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*20.

පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා,— ජාතික පාරිසරික පනත යටතේ නියෝග,— 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 අ සහ 23 ආ වගන්ති සමග කියවිය යුතු එකී පනතේ 32 වැනි වගන්තිය යටතේ පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 පෙබරවාරි මස 01 වැනි දින අංක 1534/18 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.07.25 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*21.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 25 වැනි වගන්තියේ (උ) ඡේදය යටතේ, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලදුව වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද, 2008 ජනවාරි මස 10 වැනි දින අංක 1531/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.04.09 වැනි දින ඉදිරිපත් කරන ලද “2008 අංක 1 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ( තේ කර්මාන්ත ශාලා ඉදි කිරිම සහ ක්‍රියාත්මක කිරීම) අවම ප්‍රමිති නියෝග” අනුමත කළ යුතු ය.

*22.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥා පනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥා පනතේ 32 වැනි වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 වැනි දින අංක 1544/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*23.

වෛද්‍ය ආඥා පනත යටතේ නියෝග,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ඔක්තෝබර් 03),— "(105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥා පනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2006 අගෝස්තු මස 17 වැනි දින අංක 1458/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2006.09.05 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*24.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥා පනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥා පනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යවරයා විසින් මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 වැනි දින අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතු ය.

*25.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවනු ලබන මාසික දීමනාව සිය නිත්‍ය තනතුරේ මාසික වැටුපෙන් 1/3 කට සමාන මාසික දීමනාවක් විය යුතු යැයි ද, එය 2007 ජනවාරි මස 01 වැනි දින සිට ගෙවිය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ දීමනා සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට, මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනාව ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*26.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— 2002.01.28 වැනි දින රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගනු ලැබූ මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක මහතා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දාහත්වැනි සංශෝධනයේ 27(2) වගන්තිය යටතේ 2002.01.29 වැනි දින සිට නැවත එම ධූරයට පත් කරන ලදුව, ඉන් අනතුරුව රාජ්‍ය සේවයේ කරන ලද වැටුප් සංශෝධනවලට අනුව මැතිවරණ කොමසාරිස්වරයාගේ වැටුප් 2006.11.23 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරන ලද නමුත් ලේකම්වරුන්ගේ ව්‍යවස්ථාව යටතේ මෙම ධූරයට හිමි වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම සම්බන්ධයෙන් එම අවස්ථාවේ නිශ්චය නොකරන ලද හෙයින් මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක මහතා නැවත එම ධූරයට පත් කළ 2002.01.29 වැනි දින සිට ධූරය දරන තාක් කාලයට හිමි වැටුප් වර්ධක අගයන් ද වැටුපට එකතු කොට වැටුප් ගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*27.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ පාරිශ්‍රමිකය හා දීමනාව, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | |
|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. 14.400.00 | මාසික |
| | එකතුව | රු. 79,400.00 | |

සාමාජිකයින්

| | | | |
|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද පාරිශ්‍රමිකයෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ පාරිශ්‍රමිකය 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද පාරිශ්‍රමික හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*28.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 අ(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ දීමනා, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | |
|---|---|---|---|
| දීමනාව | - | රු. 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. 14.400.00 | මාසික |
| | එකතුව | රු. 79,400.00 | |

සාමාජිකයින්

| | | | |
|---|---|---|---|
| දීමනාව | - | රු. 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද දීමනාවෙන් (ඉන්ධන දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ දීමනාව 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*29.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ තීරණය,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 2(7) ඡේදය අනුව එම කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 66,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14.400.00 | මාසික |
| | එකතුව | රු. | 80,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනා | - | රු. | 12,000.00 | මාසික |
| | එකතුව | රු. | 77,000.00 | |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනාව සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද වැටුප හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*30.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ යෝජනාව,— 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව පිහිටුවන ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයන්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14,400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන්

මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගේ නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*31.

ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ වාර්ෂික වාර්තාව 2004,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2006. 07. 21 වැනි දින ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ 2004 වර්ෂයේ වාර්ෂික වාර්තාව, අවසාන ගිණුම සහ විගණකාධිපතිගේ වාර්තාව අනුමත කළ යුතු ය.

(නිවාස සහ ඉදිකිරීම් පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී)

*32.

ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යතුමා,— ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව 2005,— 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය යටතේ 2006.11.24 වැනි දින ඉදිරිපත් කරන ලද ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ 2005 වර්ෂයේ වාර්ෂික වාර්තාව, අවසාන ගිණුම සහ විගණකාධිපතිගේ වාර්තාව අනුමත කළ යුතු ය.

(ඉදිකිරීම් සහ ඉංජිනේරු සේවා පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී)

33.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

34.

උතුර සහ  නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

35.

මහවැලි සංස්කෘතික පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

36.

රංගා කලායතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

37.

කොළොන්නාව තරුණ බෞද්ධ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1]

" පනත් කෙටුම්පත  දැන් දෙවැනි වර කියවිය යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---